www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියානු ප්‍රභුව ශ්‍රී ලංකාවේ ආන්ඩු වෙනස සාදරයෙන් පිලිගනී

**Indian elite welcomes change of government in Sri Lanka**

**දීපාල් ජයසේකර විසිනි**
**2015 ජනවාරි 17**

අග්‍රාමාත්‍ය මෝදි සහ ඉන්දියානු පාලක ප්‍රභුව, ජනාධිපති ලෙස මෛත්‍රීපාල සිරිසේනගේ පත්වීම සාදරයෙන් පිලිගෙන ඇත. ශ්‍රී ලංකාව සම්බන්ධ තම අභිලාෂයන් නැවත තහවුරු කරගැනීමට සහ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ යටතේ චීනය සමග ගොඩනගාගෙන තිබූ සම්බන්ධකම් ආපසු හැරවීමට ලද අවස්ථාවක් ලෙස මෙය ඔවුන්ගේ සැලකීමට ලක්ව ඇත.

සිරිසේනගේ පත්වීම, ඇමරිකාව සිය ආක්‍රමනශීලී "ආසියාවට හැරීම" පිටුපස පෙලගැසෙන ලෙසට බල කරමින් ආන්ඩුව මත වසර ගනනාවක් තිස්සේ යෙදූ පීඩනයේ ප්‍රතිපලයකි. ඇමරිකාවේ හැරීම, කලාපය තුල චීන රාජ්‍ය තාන්ත්‍රික බලපෑම සහ ආර්ථික අනුහස බිඳ දැමීම සඳහා මිලිටරි ගැටුමට සූදානම මධ්‍යයේ, මිත්‍ර සන්ධාන සහ කඳවුරු ජාලයක් වර්ධනය කිරීම සමග එකාබද්ධව කල ආක්‍රමනික මැදිහත් වීමකි. මෙරට වරායන්හි චීන නාවුක පිවිසුම් සඳහා ඉඩ ලබා දීම ද ඇතුලු රාජපක්ෂ විසින් බීජිනය සමග ගොඩනගාගෙන තිබුනු සබඳතා, පෙන්ටගනය සහ ධවල මන්දිරයට කිසිසේත් පිලිගත නොහැකි විය.

ජනාධිපති ධුරය සඳහා මෛත්‍රිපාල සිරිසේනගේ ව්‍යාපාරය දියත් වූයේ, එක්සත් ජනපද විදේශ ප්‍රතිපත්ති සංස්ථාපිතය සමග කිට්ටු සබඳතා ඇති දෙදෙනෙකු වන හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරනතුංගගේ සහ විපක්ෂයේ එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහගේ සහාය ඇතිවය. ඇමරිකානු සහය ලද පාලන තන්ත්‍රය වෙනස් කිරීමේ ක්‍රියාවලිය සමග සම්පාත වූ ඔහුගේ මැතිවරන ව්‍යාපාරයට, එජාප ද වෙනත් පක්ෂ සහ සංවිධාන රාශියකගේ ද සහයෝගය ලැබුනි. ජනාධිපති ධුරයට පත්වීමෙන් පසුව සිරිසේන කල පලමු ප්‍රකාශය වූයේ විදේශ ප්‍රතිපත්තිය නාටකාකාර ලෙස බීජිනයේ සිට ඇමරිකාව දෙසට සහ එහි කලාපීය අනුචරයින් දෙසට, විශේෂයෙන්ම ඉන්දියාව දෙසට මාරු කෙරෙනු ඇති බවට සහතික වීමය.

එක්සත් ජනපදයේ මූලෝපායික සහකරුවා ලෙස සේවය කරන අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදිගේ ඉන්දියානු ආන්ඩුව, මෙරට මැතිවරන සමය තුල නිහඬව සිටියේය. ප්‍රතිපලය පිලිබඳව පැවති අවිශ්වාසය නිසා ඉන්දියානු ආන්ඩුව සිරිසේනට විවෘතව සහයෝගය නොදුන්නේ යම් හෙයකින් රාජපක්ෂ ජයග්‍රහනය කලහොත් ඔහු චීනයට වඩාත් සමීප වෙමින් ප්‍රතිචාර දක්වනු ඇත යන්න සැලකිල්ලට ගනිමින්ය. කෙසේ වෙතත් සිරිසේන ජනාධිපති ධුරයෙහි දිව්රුම් දීමත් සමග මෝදි විසින් නව පාලනයට සහයෝගය දීම ඇඟවුම් කරන රාජ්‍ය තාන්ත්‍රික ව්‍යාපාරයක් දියත් කර ඇත.

සිය ප්‍රථම විදෙස් සංචාරය ලෙස ඉන්දියාවට පැමිනෙන ලෙස මෝදි සිරිසේනට ආරාධනා කොට තිබේ. එසේම විදේශ කටයුතු අමාත්‍ය ශුෂ්මා ස්වරාජ්, සිරිසේනගේ විදේශ අමාත්‍යවරයා වන ඇමරිකානු සහ ඉන්දියානු ගැති ආස්ථානයක් දරන මංගල සමරවීරට ඉහල මට්ටමේ මූලෝපායික සාකච්චාවක් සඳහා ජනවාරි 18 වන දින නව දිල්ලියට පැමිනෙන ලෙස ආරාධනා කර තිබේ.

ඉන්දියාවේ ප්‍රධාන අරමුන වනු ඇත්තේ, බීජිනය විසින් චීන ආයෝජන හා ආධාර උපයෝගී කර ගනිමින්, වරායන් වලට ප්‍රවේශ වීම සහ එම වරායන් ඉන්දියානු සාගරයේ නාවුක කටයුතු සඳහා පර්යන්ත ලෙස භාවිත කිරීම ප්‍රතික්ෂේප කිරීම සඳහා සිරිසේනගේ ප්‍රතිඥා සහතික කර ගැනීමයි.

මෝදි ආන්ඩුව මෙරට තුල ඉන්දියානු අවශ්‍යතා ඉටුකර ගැනීමේදී අනුගමනය කල යුත්තේ කුමන මාර්ග දැයි පෙන්වා දෙන අදහස් හා වාර්තා වලින් ඉන්දියානු මාධ්‍ය පිරී ඇත.

"කොලඹ බල මාරුව දිල්ලියේ අවස්ථාවයි" යන ශීර්ෂ පාඨය යෙදූ ඉන්දියන් එක්ස්ප්‍රස් හි කොලමක විදේශ ප්‍රතිපත්ති විචාරක සී. රාජ් මෝහන්, "ඉන්දියාවේ දකුනු දෙසට වන්නට පිහිටි දිවයින සමග සම්බන්ධය නැවත ගොඩනගා ගැනීමට මෝදි ආන්ඩුව ඉතා හොඳ තත්වයක" සිටින බව ප්‍රකාශ කර ඇත.

බීජිනය සහ නව දිල්ලිය සමග කොලඹ සම්බන්ධතාවන්හිදී වඩා සමබර ප්‍රවේශයක් ගැනීමට සිරිසේන පොරොන්දුවී තිබීම ගැන සඳහන් කරමින් මෝහන්, පරික්ෂාකාරී ප්‍රවේශයක් ගන්නා ලෙස මෝදිට අවවාද කර තිබුනි.

තමන් හට නව ආර්ථික සහ මූලෝපායික විකල්ප මාලාවක් ලබා දී තිබෙන චීනය සමග කොලඹ ආන්ඩුවේ සබඳතා ලෙහෙසියෙන් අත්හරිනු ඇතැයි "ඉන්දියාව බලාපොරොත්තු වීම බුද්ධිමත් දෙයක් නොවන" බව ඔහු සඳහන් කලේය. මෝදිගේ ආන්ඩුව මුහුන දෙන අභියෝගය වන්නේ, ශ්‍රී ලංකාව සමග තම ආර්ථික සහ මිලිටරිමය සහයෝගීතාවය ගැඹුරු කිරීම සහ මෙරට තුල විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම, කඩිනම් කිරීමයි.

මෝහන්ට අනුව, ඉන්දියාව හෝ "ආසියාවට හැරීමේ" එහි ප්‍රධාන සහචරයින් වන එක්සත් ජනපදය, ජපානය සහ ඔස්ට්‍රේලියාව, චීන ආන්ඩුව හා එරට සමාගම් පසුගිය අවුරුදු ගනන පුරාවට මෙරටට පොම්ප කර තිබෙන ඩොලර් බිලියන ගනන් මුදල් සම්පාදනය කල යුතුය.

මෙරට සමග ඉන්දියාවේ සම්බන්ධයට බලපාන අනෙක් සාධකය වන්නේ, දිවයිනේ දෙමල ධනපති පන්තියට යම් බලය බෙදා දීමේ සැලැස්මක් ප්‍රදානය කිරීම සඳහා වන එහි ඉල්ලීමයි. නව දිල්ලියේ පැවති ආන්ඩු 26 වසරක කුරිරු සිවිල් යුද්ධය හා දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය සහ උතුරු නැගෙනහිර වෙනම රාජ්‍යයක් සඳහා වූ එහි ඉල්ලීම් තලා දැමීමට ශ්‍රී ලංකාවේ ආන්ඩු සමග සහයෝගයෙන් කටයුතු කලේය. කෙසේ වුවත් දකුනු ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්ත ධනපති පන්තියේ කොටස් හැමවිටම, යම් ආකාරයක දෙමල ස්වයංපාලනයක් සඳහා වන ඉල්ලීම් කෙරෙහි සානුකම්පික වූ අතර දිවයින තුල සිය බලපෑම ශක්තිමත් කරගැනීමේ මාධ්‍යයක් ලෙස එය දැක ගත්හ.

සිවිල් යුද්ධය අවසානවූ 2009 සිට අග්‍රාමාත්‍ය මනමෝහන් සිංගේ සහ පසුව මෝදි ගේ ඉන්දියානු ආන්ඩු, ප්‍රධාන වශයෙන් ඉන්දියානු පාර්ලිමේන්තුව තුල දෙමල ධනේශ්වර පක්ෂ වල සහය ලැබීම අරමුනු කරගනිමින් බලය බෙදාහැරීම සම්බන්ධ කාරනය රාජපක්ෂ සමග සාකච්ඡා කර තිබුනි. "දෙමල සුලුතරය සමග අවශ්‍ය දේශපාලන සංහිඳියාවක් සම්බන්ධ ඉන්දියානු උත්සුකයන් සැලකිල්ලට ගැනීමට රාජපක්ෂ දැක්වූ අකමැත්ත" නව දිල්ලිය සහ කොලඹ අතර ආතතියේ ප්‍රධාන මූලයක් වූ බව රාජ් මෝහන් ඉන්දියන් එක්ස්ප්‍රස් හි සඳහන් කලේය.

දෙමල ජාතික සන්ධානයේ සම්පූර්න සහයෝගය ඇතිව බලයට පැමිනි සිරිසේන දෙමල ධනේශ්වරයට යම් සහන සැලසීමක් සඳහා වැඩි නැඹුරුවක් දක්වනු ඇතැයි අපේක්ෂිතය. කෙසේ වෙතත් එම කාරනය සම්බන්ධයෙන් පරිස්සම් සහගතව ක්‍රියා කිරීමට මෝදිගෙන් ඉල්ලීම් කෙරේ. සිරිසේනගේ නව රජය පදනම්ව ඇත්තේ, සිවිල් යුද්ධයේ ආරම්භක වෙඩි මුරය බවට පත්වූ සිංහල වර්ගවාදී පිලිවෙත් වැලඳගත් එජාපය මත පමනක් නොවේ. එය අන්ත සිංහල වර්ගවාදී ජාතික හෙල උරුමය වැනි ප්‍රවනතා මතද පදනම් වේ.

එමෙන්ම සිරිසේන, යුද්ධය අවධියේ රාජපක්ෂ මෙන්ම දෙමල සිවිල් ජනතාවට එරහිව යුද අපරාධ සිදු කිරීමට හවුල් වූ අයෙකි. හමුදාව විසින් එල්ටීටීඊ නායකයන් තොග පිටින් මරාදමන ලද සහ දහස් ගනන් සිවිල් වැසියන් ඝාතනය කරන ලද යුද්ධයේ අවසන් සති කිහිපය තුල තමන් වැඩ බලන ආරක්ෂක ඇමති ලෙස කටයුතු කිරීම පිලිබඳව මැතිවරනය ව්‍යාපාරය තුලදී ඔහු පම්පෝරි ගැසීය.

චීනය සමග සබඳතා හීන කිරීම සහ දෙමල ප්‍රදේශ තුල යම් ආකාරයක බලය බෙදා හැරීමක් ප්‍රදානය කිරීම මගින් සිරිසේන කියන දේ ක්‍රියාවට නගන්නේ දැයි ඉන්දියාවට මදක් ඉවසීමෙන් බලාසිටීමට සිදුවන බව ඉන්දියානු විශ්ලේෂක රාජීව් ශර්මා ජනවාරි 10 වැනිදින ෆස්ට් පොස්ට් තුල තරයේ කියා සිටියේය. දැනට ක්‍රියාත්මකවන සියලු අධම කුමන්ත්‍රන සහ කුටෝපායන් තුල ඉන්දියාව සහ එක්සත් ජනපදය වඩාත්ම සැලකිලිමත් වන්නේ ශ්‍රී ලංකාව බීජිනයෙන් ඉවතට හැරවීමටය.

© www.wsws.org